# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1993 අංක 7 දරන
# පළාත් සභා ඡන්ද විමසීම්
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1993 පෙබරවාරි මස 18 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

1993 පෙබරවාරි මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.**

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී**

---

**කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය**

**මිල : ශත 45 යි.** තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1993 අංක 7 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1993 පෙබරවාරි මස 18 වන දින]

**එල්. ඩී.—ඕ. 1/93**

**1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—**

**1.** මේ පනත 1993 අංක 7 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 15 වන වගන්තිය, එහි (3) වන උප වගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1988 අංක 2 දරන පනත සංශෝධනය කිරීම.

"(3) ස්වාධීන කණ්ඩායමක් විසින් යම් පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා නාම යෝජනා කරන ලද කිසිම අපේක්ෂකයකු, ඒ පරිපාලන දිස්ත්‍රික්කයෙන්, පළාත් සභාවට තෝරා පත් කරගනු නොලැබූ අවස්ථාවක, ඒ කණ්ඩායමේ අපේක්ෂකයන් වෙනුවෙන් තබන ලද තැන්පත් මුදල රජය සන්තක කරනු ලැබූ ලෙස ප්‍රකාශ කරනු ලැබිය යුතු අතර, තෝරීම් භාර නිලධරයා විසින් තැන්පත් ගිණුමෙන් ඒකාබද්ධ අරමුදලට ඒ මුදල මාරු කළ යුතු ය : තවද අනෙක් සෑම අවස්ථාවකදීම, ඡන්ද විමසීමේ ප්‍රතිඵල ප්‍රකාශ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින්, ඒ තැන්පත් මුදල එසේ තැන්පත් කළ තැනැත්තාට ආපසු දෙනු ලැබිය යුතු ය.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 125 වන වගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය, ඒ ප්‍රඥප්තියේ 125අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියේ 125අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"නියමිත ඡන්ද පොළක දී ඡන්දය දීමට නොහැකිවීම පිළිබඳ සාධාරණ බියක් ඇති විට ඡන්දය දීමේ කාර්ය පටිපාටිය.

**125අ.** (1) වෙනත් යම් නීතියක කුමක් සඳහන් ව ඇතද, තමාගේ ඡන්ද පොළ පිහිටි ප්‍රදේශයේ පවතින තත්ත්වය හේතුකොටගෙන තමාට ඒ ප්‍රදේශයෙන් පිටත පදිංචිව සිටීමට අනිවාර්ය යෙන්ම සිදුවන හා ඒ ඡන්ද පොළේ දී තමාට, තමාගේ ඡන්දය දීමට නොහැකි වේතැයි සාධාරණ බියක් ඇති, යම් ලියාපදිංචි ඡන්දහිමියකු විසින්, තමාගේ ඡන්දය කොමසාරිස්වරයා විසින් ඔහුගේ පරම අභිමතය පරිදි තීරණය කරනු ලබන්නා වූ වෙනත් ඡන්ද පොළක දී දීමට අවසර දෙන ලෙස ඉල්ලමින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉල්ලුම් පත්‍රයක්, නාමයෝජනා දැන්වීමෙන් එක් සතියක් ඇතුළත දී ඉදිරිපත් කළ හැකි ය.

2—ඩී 026114—5,930 (93/01)

(2) එවැනි ඉල්ලුම් පත්‍රයක් ලැබීමෙන් සතියක් ඇතුළත කොමසාරිස්වරයා විසින් එම ඉල්ලුම් පත්‍රය භාර ගන්නා ලද බව නැතහොත් ප්‍රතික්ෂේප කරන ලද බව එම ඡන්ද හිමියාට දැන්විය යුතු ය. කොමසාරිස්වරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන අතර, එය කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(3) එවැනි ඡන්දයක් දී ඇති අවස්ථාවක, එම ඡන්දය, එම ඡන්ද හිමියා ලියාපදිංචි වී ඇති මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද සමග ගණන් කරනු ලැබිය යුතුය.".

අනනුකූලතාවක් ඇතිවූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 255, බෞද්ධාලෝක මාවත, කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.